ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

# NEWSLETTER

RIGHT TO INFORMATION

කලාපය 03

දෙසැම්බර් 2021




**Moderator**
**Mr. Javid Yusuf**
Attorney at Law
Former Sri Lanka's ambassador to Saudi Arabia



**Mr. Toby Mendel**
Director
Centre for Democracy and Law, Canada

TOPIC : **Overview of RTI in South Asia in making the political establishment accountable to RTI**



**Ms. Kishali Pinto Jayawardene**
Commissioner
RTI Commission of Sri Lanka

TOPIC : **RTI rulings in respective countries advancing governance/making the political establishment accountable**



**Mr. Zahid Abdullah**
Federal Information Commissioner
Pakistan Information Commission

TOPIC : **RTI rulings in respective countries advancing governance/making the political establishment accountable**



**Mr. Rohana Hettiararchi**
Executive Director
Peoples Action for Free & Fair Elections (PAFFREL)/General Secretary of Asian Network for Free Election (ANFREL)

TOPIC : **RTI in elections law/exposing corruption**



**Mr. Anushan Kapilan**
Lead researcher
PublicFinance.lk
Verité Research

TOPIC : **"RTI and Public Funds"**



**Mr. Venkatesh Nayak**
Coordinator
the Access to Information Programme, Commonwealth Human Rights initiative, India

TOPIC : **Using RTI to Protect Public Funds in India - Current Challenges**

# “තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා දේශපාලනය වගවීම කරා යොමු කරවීම”

මාර්ගගත සාකච්ඡාව

## තොරතුරු සඳහා විශ්වීය ප්‍රවේශය උදෙසා වූ ජාත්‍යන්තර දිනය 2021 (IDUAI) 2021

තොරතුරු වෙත ප්‍රවේශ වීමේ වැදගත්කම හඳුනා ගනිමින් යුනෙස්කෝව (UNESCO) සෑම වසරකම සැප්තැම්බර් 28 වැනි දින තොරතුරු සඳහා විශ්වීය ප්‍රවේශය උදෙසා වූ ජාත්‍යන්තර දිනය (IDUAI) ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

මෙම තොරතුරු සඳහා විශ්වීය ප්‍රවේශය උදෙසා වූ ජාත්‍යන්තර දිනය සඳහා 2021 වසරෙහි තේමාව වශයෙන්, ”මහජන යහපත සහ තිරසාර සංවර්ධනය සඳහා ශක්තිමත් ආයතන ගොඩනැගීමට මෙන්ම, මෙම මානව හිමිකම් ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍රයෙහි ලා තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා තොරතුරු නීතිවලට ප්‍රවේශ වීමේ කාර්‍යභාරය හා ඒවා ක්‍රියාත්මක කිරීමේ කාර්යයභාරය” ඉස්මතු කරයි. යුනෙස්කෝව සමඟ මෙම පණිවිඩය නැවත අවධාරණය කරමින් සිය තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රයේ 2030 ඉලක්කවලට ප්‍රමුඛත්වය දෙමින් තොරතුරු දැනගැනීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීම සඳහා, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් ශ්‍රී ලංකාව සහ දකුණු ආසියානු කලාපය නියෝජනය වන පරිදි, ‘තොරතුරු දැනගැනීමේ අයිතිය’ විෂයය කෙරෙහි විශේෂිතව කටයුතු කරනු ලබන විශේෂඥ මණ්ඩලයක් සමගින් සැසි දෙකකින් යුත් මාර්ගගත සාකච්ඡාවක් පැවැත්විය.

www.slpi.lk

වැඩසටහන පිළිබඳ
වැඩිදුර තොරතුරු පරිශීලනය
සඳහා කරුණාකර පහත
QR කේතය භාවිතා කරන්න

www.youtube.com
SLPIMEDIA

# RTI Journalists' Forum

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් මාසිකව පවත්වනු ලබන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ජනමාධ්‍යවේදී සංසදයේ දී 2021 වසර තුළ කතිකාවට ලක් කොට, තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිත කොට විමසන ලද පුවත්මය වටිනාකමකින් යුත් පොදු ගැටලු කිහිපයක් පහතින් ඉදිරිපත් කෙරේ.



ප්‍රංශ සංවර්ධන ආයතනයේ ආධාර සහිතව අනුරාධපුර නගරයේ ක්‍රියාත්මක වන උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු මන්දගාමී බව අවධානයට ලක් වූ හෙයින් ඒ පිළිබඳ සොයා බැලීම සඳහා තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.




පසුගිය සමයේ කොපමණ කොවිඩ් එන්නත් ප්‍රමාණයක් කොපමණ වර්ග වලින් මෙරටට ආනයනය කළේ ද යන්න සොයා බැලීම සඳහා තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.



මෙරටට ආනයනිත පොල් තෙල් වල ඇෆ්ලටොක්සීන් අඩංගු බවට මතයක් පැතිර ගියෙන්, මෙරටට එසේ ආනයනය කරන ලද පොල් තෙල් ප්‍රමාණ සහ ඒවා මහජනතාවට නිකුත් කිරීමට පෙර ඒවාහි තත්ත්වය පරීක්ෂා කෙරෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව සොයාබැලීමට තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.



ගෘහස්ථව සිදු කරන ලද PCR පරීක්ෂණ සංඛ්‍යාලේඛන, PCR පරීක්ෂණ කට්ටල ආනයනය, PCR පරීක්ෂණ කට්ටල මිලදී ගැනීමට කළ වියදම් පිළිබඳව සොයාබැලීමට තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.



පසුගිය වසර වල මෙරට වී අස්වැන්න, වගා සඳහා පොහොර භාවිතය, ගෘහස්ත කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා වගකිවයුතු ආයතන විසින් ගෙන ඇති පියවර පිළිබඳව සොයාබැලීමට තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.



ආනයනය කරන ලද කොවිඩ් එන්නත් දිස්ත්‍රික්ක වශයෙන් බෙදා හැරීම සහ දිස්ත්‍රික් මට්ටමින් එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සොයාබැලීමට තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.



වසංගත සමයේ පාසැල් සිසුන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයාගැනීම උදෙසා රජය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳ විමසා තොරතුරු ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.



ආනයන තහනමෙන් පසු මෙරටට නීති විරෝධී ලෙස ගෙන එන ලද කහ තොග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව ගත් පියවරයන් පිළිබඳව සහ දේශීය කහ වගාව නගාසිටුවීම සඳහා රජය ගත් පියවරයන් පිළිබඳව සොයාබැලීමට තොරතුරු අයදුම්පත් යොමු කරන ලදී.

# 2021 Year in Review

**තොරතුරු ඉල්ලීම්**
**174 ක්**


**විශේෂාංග**
**58 ක්**

**සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වයන්**
**161,483ක්**

**විචාරාත්මක කතිකාවත්**
**3 ක්**

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටෙහි පවත්නා දැඩි අර්බුදකාරී තත්ත්වය යටතේ වුව ද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් විය. එහි දී අප විසින් ප්‍රවෘත්ති මැදිරි 25ක් සමඟ එක්ව කටයුතු කළ අතර, ඔවුන් සඳහා අපගේ “RTI Help Desk” සේවාව ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අප සමත් විය.

මීට අමතරව පොදු ජනතාව තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වන “RTI Helpline” තොරතුරු දැනගැනීමේ සහායක සේවාව ද වසර පුරා අඛණ්ඩව පවත්වාගැනීමට සහ ඒ ඔස්සේ ජනතාවට අවශ්‍ය සහාය ලබා දීමට සමත් වුණෙමු.




**සමාජ මාධ්‍ය පරිශීලන දත්ත සටහන**
**[වයස් කාණ්ඩ මත පදනම්ව]**

කලාපය 03 | දෙසැම්බර් 2021

# A Success Story

www.rtisrilanka.lk

## අපි අයිති කාටද?

මූලික අවශ්‍යතා නොමැතිව පීඩා විඳින අරබා නගර්, කොක්කුලන්කාල් ප්‍රදේශයේ දුක් විඳින ජනතාව පිළිබඳව පසුගියදා පුවත්පතක වාර්තාවක් පළ වී තිබිණි. අරබා නගර්, කොක්කුලන්කල් ප්‍රදේශයේ ජනතාව පානීය ජලය, වැසිකිලි, මාර්ග සංවර්ධනය, විදුලිය වැනි මූලික පහසුකම් නොමැතිව ජීවත් වන බව ඉන් අනාවරණය කර තිබිණි. එම ජනතාවට මූලික පහසුකම් ලබා නොදුන්නේ මන්දැයි තොරතුරු දැනගැනීමේ පනත ඔස්සේ අපි ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ අට්ටාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා සිටියෙමු. එහි දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් දෙක එකිනෙකට වෙනස් පිළිතුරු ලබා දුන් බව නිරීක්ෂණය කරන ලදී.

කියවන්න :

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මාධ්‍යවේදීන් සඳහා තොරතුරු පනත පිළිබඳ වැඩමුළුවක්

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මාධ්‍යවේදීන් සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳ වැඩමුළුවක් පසුගිය 11 වැනිදා ත්‍රිකුණාමලයේදී පැවැත්විණි. ඒකද් කැරිටස් විසින් මෙම වැඩමුළුව සංවිධානය කර තිබූ අතර ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් වැඩමුළුව පවත්වන ලදී. මෙම වැඩමුළුවේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳ පැහැදිලි කිරීම් සිදු කරන ලදී. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන් 25කට අධික පිරිසක් මේ සඳහා සහභාගි වී සිටියහ. මෙම වැඩමුළුව සඳහා පහසුකම් සපයන ලද්දේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ උපදේශක සහ සිංහල භාෂා පැමිණිලි නිලධාරී කමල් ලියනාරච්චි විසිනි.



ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

RTI SRI LANKA

No.96, කිරුළ පාර, කොළඹ 05.
Email: info@slpi.lk
Tel: +94 011 5 353 635
Fax: +94 011 5 335 500

www.rtisrilanka.lk
වැඩිදුර කියවීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න

© Sri Lanka Press Institute : 2021